# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2477/35 - 2026 පෙබරවාරි මස 25 වැනි බදාදා - 2026.02.25**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

### ගරු ජනාධිපතිතුමා විසින් කරනු ලබන ප්‍රකාශනයයි

මුද්‍රාව

අනුර කුමාර දිසානායක

ස්වස්ති !

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති වූ ද, රජයේ ප්‍රධානයා වූ ද, විධායකයේ සහ ආණ්ඩුවේ ප්‍රධානයා වූ ද, සන්නද්ධ සේනාවන්හි සේනාධිනායක වූ ද, අනුර කුමාර දිසානායක වන මවිසින් සියලු දෙනා වෙත ශුභාශිංසන පූර්වකව මෙසේ නිවේදනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගුවන් හමුදාවට අයත් නිත්‍ය හා ස්වේච්ඡා බල සේනාවල නියුක්ත සෑම තරාතිරමකම සියලුම පුද්ගලයන්ට සහ ගුවන් හමුදාවට අනුයුක්තව රාජකාරි කරනු ලබන ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ අනුමත සේවක සංඛ්‍යාවට අයත් සිවිල් සේවකයින්ට ද 75 වන ගුවන් හමුදා සංවත්සරය අනුස්මරණය කිරීම සඳහා සමරු පදක්කමක් පිරිනැමීම මාගේ අභිලාෂය වන බැවින් ද,

ඒ සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගුවන් හමුදාවට අයත් වූ ද, මෙම ප්‍රදානය ලැබීමට නිසි සුදුසුකම් ඇත්තා වූ ද සෑම තරාතිරමකම පුද්ගලයන්ට, ඔවුන් විසින් මහත් සේ අගය කරන්නා වූ නවතම පදක්කමක් ප්‍රතිෂ්ඨාපනය කොට, ව්‍යවස්ථාපනය කොට නිර්මාණය කිරීම මාගේ අභිප්‍රාය හා කැමැත්ත වන බැවින් ද,

එම කාර්යයෙහිලා පාලනය කිරීම සඳහා මින් ඉදිරියට අනුල්ලංඝනීය වශයෙන් පිළිපැදිය යුතු වූ, ව්‍යවස්ථා හා රෙගුලාසි දැන් මවිසින් මෙසේ සම්පාදනය කොට, නියම කොට සංස්ථාපනය කරනු ලැබේ.

1A - G 46356 — 04 (2026/02)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**පළමුව:**

සංඥා නාමය සහ හැඳින්වීම - මෙම පදක්කම **"75 වන ගුවන් හමුදා සංවත්සර සමරු පදක්කම"** යන නාමයෙන් හැඳින්විය යුතු යයි නියම කරනු ලැබේ.

**දෙවනුව:**

විස්තරය - ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් ස්වකීය ප්‍රධානියා වන ගුවන් හමුදාධිපති සමග එක්ව මාණ්ඩලික ප්‍රධානියාගේ ද, නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානියාගේ ද, අධ්‍යක්ෂ ජෙනරාල්වරුන්ගේ ද, අධ්‍යක්ෂවරුන්ගේ ද, පීඨාධිපතිගේ ද, මූලික කඳවුරු අණදෙන නිලධාරීන්ගේ ද, කඳවුරු අණදෙන නිලධාරීන්ගේ ද සහාය ලබාගෙන යුධ මූලධර්ම 10 ට අනුකූලව සතුරාට විරුද්ධව සටන් කොට ශ්‍රී ලංකා ස්වාධිපත්‍ය ආරක්ෂා කිරීම සංකේතවත් වන පරිදි කෲප්‍රෝ නිකල් ලෝහයෙන් මෙම පදක්කම හැඩගැන්විය යුතු අතර, එහි ඉදිරිපස මධ්‍යයෙහි 75 වන සංවත්සරය සැමරීම සංකේතවත් කරමින් 75 යන ඉලක්කම ද, එයට ඉහළින් "සුරකිමු ලකඹර" යන ගුවන් හමුදා ආදර්ශ පාඨය ද පහළින් "ශ්‍රී ලංකා ගුවන් හමුදාව" ද යෙදිය යුතු ය. 75 ඉලක්කමට දකුණු පසින් පියාසර ආකාරය නිරූපණය වන ගුවන් යානා තුනක් මඟින් ගුවන් හමුදාවේ ප්‍රහාරක බලය සහ ප්‍රවාහන හැකියාව සංකේතවත් කරමින් ගුවන් හමුදාව සතු ප්‍රහාරක ගුවන් යානයක්, පියාපත් සහිත ගුවන් යානයක් සහ හෙලිකොප්ටර් යානයක් නිරූපණය කළ යුතුය. පදක්කම අනෙක් පස මධ්‍යයේ ගුවන් හමුදා ලාංඡනය ද, එයට වම්පසින් ගුවන් හමුදාව පිහිටුවීමේ වර්ෂය සංකේතවත් කරමින් "1951" යනුවෙන් ද, දකුණුපසින් 75 වන සංවත්සරය සංකේතවත් කරමින් "2026" යනුවෙන් ද, ගුවන් හමුදා ලාංඡනයට ඉහළින් සිංහල බසින් හා ගුවන් හමුදා ලාංඡනයට පහළින් දමිළ බසින් "ශ්‍රී ලංකා ගුවන් හමුදාව" යනුවෙන් ද, ලාංඡනයේ පිටත නිල් මානෙල් මල නිරූපණය වන පරිදි ඇති පෙති වල හැඩයෙන් ශ්‍රී ලංකා ගුවන් හමුදා විද්‍යාපීඨය හා මූලික කඳවුරු නියෝජනය කරමින් ද, එම පෙති ඇතුලත ත්‍රිකෝණාකාර හැඩතල මගින් ශ්‍රී ලංකා ගුවන් හමුදා කඳවුරු දාහත (17) නියෝජනය කරමින් ද දැක්විය යුතු ය.

**තුන්වනුව:**

පීත්ත පටිය - පීත්ත පටියේ දිග මි.මී 30ක් ද, පළල මි.මී 10ක් ද වන අතර, තීරු නවයකින් සමන්විතව, වම් පස සිට දකුණු පසට සමාන තීරු හතර පිළිවෙලින් කහ, මෙරුන්, තද කොළ, තැඹිලි වර්ණයන්ගෙන් ද, මධ්‍ය තීරුව ලා නිල් වර්ණයෙන් ද, නැවත මුල් තීරු හතරෙහි විරුද්ධ පිළිවෙලින් සමාන තීරු හතරකින් තැඹිලි, තද කොළ, මෙරුන් සහ අවසාන තීරුව කහ පැහැති වර්ණයෙන් ද, සමන්විත විය යුතු ය.

**සිව්වනුව:**

සුදුසුකම් - වර්ෂ දෙදහස් විසිහයක් වූ මාර්තු මස දෙවන දින වන විට ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සක්‍රිය සේවයේ සිටින්නා වූ, ප්‍රශංසනීය වූත්, රාජපාක්ෂික වූත්, අකලංක වූත් සේවයක් හිමි සියලුම සේවා පුද්ගලයන්හට හා ස්ථිර සිවිල් සේවා පුද්ගලයින්ට සහ සියලුම කෙඩෙට් නිලධාරීන්, ශිෂ්‍ය නිලධාරීන් හා ආධුනිකයින්ට (පදක්කම පැළඳීමට අනුමැතිය ලබා දිය යුත්තේ අධිකාරියට පත්කිරීම්/ විසිර යාම අවසන් කිරීමෙන් පසුව ය) මෙහි මින්මතු සම්පාදනය කොට දැක්වෙන රෙගුලාසිවල විග්‍රහ වන නියමයන් හා කොන්දේසි අනුව මෙම ප්‍රදානය ලැබීමට යෝග්‍යයැයි ගුවන් හමුදාධිපති විසින් නිර්දේශ කරනු ලබන්නා වූ ද සියලුම පුද්ගලයින්ට මෙම පදක්කම ප්‍රදානය කළ යුතු යයි නියම කරනු ලැබේ.

**පස්වනුව:**

ලියාපදිංචි කිරීම - මෙම පදක්කම ප්‍රදානය කරනු ලබන සියලුම අයගේ නම්, ශ්‍රී ලංකා ගුවන් හමුදා චර්යා නියෝගයන්හි ප්‍රසිද්ධ කළ යුතු යයි ද, අදාළ සේවාධිපතීන්ගේ විධානය යටතේ එම නම් ඇතුළත් නාම ලේඛනයක් පවත්වාගෙන යා යුතු යයි ද නියම කරනු ලැබේ.

**සයවනුව:**

පැළඳීමේ අනුපිළිවෙල - ප්‍රසාධන පළඳනා හා පදක්කම් පැළඳීමේ අනුපිළිවෙල පෙන්නුම් කෙරෙන නිල ලේඛනයෙහි සුවිශේෂි දිනය සැමරීම වස් හිමිගන්වා ඇති ශ්‍රී ලංකා ජනරජ ගුවන් හමුදා ස්වර්ණ ජයන්ති පදක්කමට ආසන්නතම ඉදිරියෙන්, 75වන ගුවන් හමුදා සංවත්සර සමරු පදක්කම පැළඳිය යුතු යයි නියම කරනු ලැබේ.

**සත්වනුව:**

කුඩා අනුරූප - පදක්කම්ලාභීන් විසින් ඇතැම් අවස්ථාවන්හි දී පළඳින්නා වූ ද, කුඩා ප්‍රමාණයේ පදක්කම් යනුවෙන් හැඳින්වෙන්නා වූ ද, කුඩා ප්‍රමාණයේ පළඳනාවේ ප්‍රමාණය, දළ වශයෙන් ප්‍රදානය කරන ලද පදක්කමේ ප්‍රමාණයෙන් අර්ධයක් තරම් විය යුතු අතර, එම කුඩා අනු රූපයේ මුද්‍රා තැබූ ආදර්ශයක් ගුවන් හමුදා මූලස්ථානයේ තැන්පත් කර තැබිය යුතු යයි නියම කරනු ලැබේ.

**අටවනුව:**

අහිමි කිරීම සහ පෙරළා හිමිකර දීම - මෙහි මින්මතු පනවනු ලබන රෙගුලාසි යටතේ යම් කිසි පුද්ගලයෙකු වෙත ප්‍රදානය කර ඇති පදක්කමක් අවලංගු කොට නිෂ්ප්‍රභ කිරීමේ බලය සහ අහිමි කෙරෙන ප්‍රදානයක් පෙරළා හිමිකර දීමේ බලය ජනාධිපති වශයෙන් මා සතු වන බව නියම කරනු ලැබේ. තවද එපරිද්දෙන් ප්‍රදානයක් අවලංගු කෙරෙන හෝ පෙරළා හිමිකර දෙන සෑම අවස්ථාවක දී ම ඒ බව ගුවන් හමුදා චර්යා නියෝගවල පළ කළ යුත්තේ ය.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රාජ්‍ය මුද්‍රාව යටතේ, දෙදහස් විසිහයේ පෙබරවාරි මස 24 වැනි දින ජනාධිපති කාර්යාලයේදී නිකුත් කරන ලදී.

ගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

**ආචාර්ය එන්. එස්. කුමානායක,**
ජනාධිපති ලේකම්.

## 75 වන ගුවන් හමුදා සංවත්සර සමරු පදක්කම

ජනාධිපති බලපත්‍රයේ දක්වා ඇති විධිවිධානවලට විස්තර වශයෙන් 75 වන ගුවන් හමුදා සංවත්සර සමරු පදක්කම පිරිනැමීම. අහිමි කිරීම. පෙරළා හිමිකර දීම සහ ඒ හා සම්බන්ධ වෙනත් කරුණුවලට අදාළව. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු ජනාධිපතිතුමා විසින් පනවන ලද රෙගුලාසි.

ගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

**ආචාර්ය එන්. එස්. කුමානායක,**
ජනාධිපති ලේකම්.

2026 පෙබරවාරි මස 24 වැනි දින.
කොළඹ - 01.
ජනාධිපති කාර්යාලයේදී ය.

### 75 වන ගුවන් හමුදා සංවත්සර සමරු පදක්කම පිළිබඳ රෙගුලාසි

1. වර්ෂ දෙදහස් විසිහයක් වූ මාර්තු මස දෙවන දින වන විට ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සක්‍රීය සේවයේ සිටින්නා වූ, ප්‍රශංසනීය වූත්, රාජපාක්ෂික වූත්, අකලංක වූත් සේවයක් හිමි සියලුම සේවා පුද්ගලයන්හට හා ස්ථිර සිවිල් සේවා පුද්ගලයින්ට සහ සියලුම කෙඩෙට් නිලධාරීන්, ශිෂ්‍ය නිලධාරීන් හා ආධුනිකයින්ට (පදක්කම පැලදීමට අනුමැතිය ලබා දිය යුත්තේ අධිකාරියට පත්කිරීම/විසිර යාම අවසන් කිරීමෙන් පසුව ය) මෙහි මින්මතු සම්පාදනය කොට දැක්වෙන රෙගුලාසිවල විග්‍රහ වන නියමයන් හා කොන්දේසි අනුව මෙම ප්‍රදානය ලැබීමට යෝග්‍යයැයි ගුවන් හමුදාධිපති විසින් නිර්දේශ කරනු ලබන්නා වූ ද සියලුම පුදගලයින් මෙම පදක්කම ලැබීමට සුදුස්සෝ වෙති.

2. පහත සඳහන් අයවලුන් මෙම පදක්කම ලැබීමට සුදුස්සෝ නොවෙති.

   (අ) 2026 මාර්තු මස 01 වන දින වන විට නිවාඩු නොමැතිව සේවයට නොපැමිණි අය හෝ සේවයෙන් පලා ගිය අය.

   (ආ) 2026 මාර්තු මස 01 වන දින වන විට තමන් විසින්ම තමන්ට තුවාලයක් හෝ තමන් විසින් තම ජීවිතය නැතිකර ගැනීමට උත්සාහ කර ඇති අය හෝ හිතාමතා තම රාජකාරින් පැහැර හැර ඇති පුද්ගලයින්.

3. සෑම නිර්දේශයක් සමග. නිර්දේශිත පුද්ගලයාගේ අංකය. නිලය හා සම්පූර්ණ නම ද ඉදිරිපත් කළ යුතු ය.

4. පදක්කම් පිරිනමනු ලැබූ අයගේ නම් ගුවන් හමුදා චර්යා නියෝගවල පළ කළ යුතු අතර, මෙම පදක්කම්ලාභීන් සියලු දෙනාගේම නාමලේඛන ගුවන් හමුදාධිපතිගේ විධානය යටතේ පවත්වාගෙන යා යුතු ය.

5. පදක්කම පිරිනමනු ලැබ සිටියදී ගුවන් හමුදාවෙන් අපකීර්ති සහගතව සේවයෙන් පහකරනු ලබන. නින්දිත ලෙස සේවයෙන් මුදාහරිනු ලබන, ඉවත් කරනු ලබන. අධිකාරියෙන් ඉල්ලා අස්වීමට හෝ විශ්‍රාම ගැනීමට නියම කරනු ලබන සෑම ගුවන් හමුදා පුද්ගලයකුටම ගරු ජනාධිපතිතුමා විසින් වෙනත් අයුරක නියෝගයක් නොකරන තාක් එම පදක්කම අහිමි වී යන්නේ ය.

6. යම් පුද්ගලයෙක් මෙම පදක්කම පිරිනමනු ලැබ සිටියදී, රාජද්‍රෝහීකම, භේදය, කැරළි ගැසීම, බියසුළුකම, අස්වාභාවික අන්දමේ නින්දනීය හැසිරීම වැනි වරදකට වරදකරු වූයේ නම් හෝ විෂමාචාරය නිසා සේවයෙන් පහකරනු ලැබුවේ නම් හෝ ගුවන් හමුදාවේ නීතියට යටත්ව සිටියදී සිවිල් බලධාරීන් විසින් වරදකරුවෙක් කරනු ලැබුවේ නම් එවිට එම පුද්ගලයාට ගරු ජනාධිපතිතුමා විසින් වෙනත් අන්දමේ නියෝගයක් නොකරන තාක් එම පදක්කම අහිමි වී යන්නේ ය.

7. යම් තැනැත්තෙකුට අහිමි වී ගිය පදක්කමක් ස්වකීය අභිමතය පරිදි පෙරළා හිමිකර දීමට ගරු ජනාධිපතිතුමාට හැකි ය.

8. අහිමි කිරීමක් හෝ පෙරළා හිමිකර දීමක් සිදු වන සෑම අවස්ථාවකදී ම ඒ පිළිබඳ නිවේදනයක් ගුවන් හමුදා චර්යා නියෝගවල පළ කළ යුතු ය.

9. යම් නිලධාරියෙක්, ගුවන් භටයෙක් හෝ සිවිල් සේවක මහතෙකු අතින් නැති වූ පදක්කම වෙනුවට වෙනත් එකක් ලබා ගැනීමට අදහස් කරන්නේ නම් එම නිලධාරියා, ගුවන් භටයා හෝ සිවිල් සේවක මහතා විසින් එම පදක්කම නැති වූ අන්දම ගැන ප්‍රකාශයක් සිය අණදෙන නිලධාරියා/ උසස් නිලධාරියා වෙත ඉදිරිපත් කළ යුතු ය. ඉන් පසුව එම ප්‍රකාශය යථා මාර්ගයෙන් ගරු ජනාධිපතිතුමන් වෙත ඉදිරිපත් කළ යුත්තේ ය. නැතිවීම සම්බන්ධයෙන් දක්වා ඇති කරුණු සතුටුදායක බව පිළිගනු ලැබුවහොත් එවිට නැති වූ පදක්කම වෙනුවට වෙනත් පදක්කමක් නියමිත මුදලක් ගෙවා ලබාගත හැකි ය.

10. ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලස්ථානය විසින් සියලුම නැතිවීම්, අහිමි කිරීම් හා ප්‍රතිස්ථාපනයන් ආදිය සිදු වූ අවස්ථාවන් පිළිබඳ විස්තර සටහන්කර තබාගත යුතුය.


11. මෙම නියෝගවල -

(අ) ‘‘ගුවන් හමුදා’’ යන්නෙන් - ශ්‍රී ලංකා ගුවන් හමුදාව

අදහස් කෙරෙන බව සැලකිය යුත්තේ ය.

## ශ්‍රී ලංකා ජනරජ ගුවන් හමුදා 75 වන සංවත්සර පදක්කම

ඉදිරිපස




පිටුපස




පීත්ත පටිය



EOG 02 - 0210